# 12
# කුච්චිපුඩි හා භරත නාට්‍ය සම්ප්‍රදා

*තුෂාණි සංකල්පනා ලියනගේ* [1]
HU/2011/2322

කුච්චිපුඩි හා භරත නාට්‍ය සම්ප්‍රදායන්හි විශේෂ ලක්‍ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වේ. කුච්චිපුඩි සම්ප්‍රදාය මෙන් ම භරත නාට්‍ය සම්ප්‍රදාය ද හින්දු ආගමික සම්භවයක් සහිත ව ඉන්දියාවේ ජනප්‍රියවූ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදා දෙකක් ලෙස හැඳින්විය හැකිය. මෙකී සම්ප්‍රදා දෙක සංසන්දනය කිරීමේදී එකිනෙකාට ආවේණික වූ ලක්ෂණ මෙන් ම පොදු අංග ද හඳුනා ගැනීමට ද හැකියාව ලැබේ. එබැවින් එකී සම්ප්‍රදා දෙක පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කිරීම මගින් එකම මූලයකින් ප්‍රභවය ලැබූ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදා දෙකෙහි ආවේණික ලක්ෂණ හඳුනා ගැනීමට අපේක්ෂිත ය. මෙම මාතෘකාව සඳහා එම සම්ප්‍රදා දෙක පිළිබඳ ලියැවී ඇති විදේශීය මූලාශ්‍ර හා දේශීය මූලාශ්‍ර මඟින් තොරතුරු ලබා ගත් අතර දෘශ්‍ය මූලාශ්‍ර (වීඩියෝ) ද ඉහත අරමුණ විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලදී. මෙම මාතෘකාව පිළිබඳ ගත් විට මෙම සම්ප්‍රදායන් දෙක ම නෘත, නෘත්‍ය, නාට්‍ය යන ත්‍රිවිධ අංග මත නිර්මාණය වී ඇති බව යොදා ගත් කෘති ඔස්සේ සොයා ගැනීමට හැකිවිය. එබැවින් එම සම්ප්‍රදා දෙකෙහි නර්තන අංග වෙන වෙනම සොයා බැලිය යුතු විය. තව ද භරත නාට්‍ය සම්ප්‍රදාය යනු ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදාවලින් ප්‍රධාන නර්තන සම්ප්‍රදායක් වන අතර එය එයට ම ආවේණිකවූ ලක්‍ෂණවලින් නිර්මාණය වී ඇත. නමුත් කුච්චිපුඩි සම්ප්‍රදාය යනු ශාස්ත්‍රීය මෙන් ම ගැමි නාටක ආභාසය ලැබී ඇති අතර එම සම්ප්‍රදාය සම්මිශ්‍රණයකින් නිර්මාණය වූවක් ලෙස හැඳින්විය හැකි ය. මෙම සම්ප්‍රදායන් දෙකම සතරවිද අභිනය ද යොදාගෙන ඇති අතර ඒ තුළ ඇති නර්තනයන් හි වෙනස්කම් දැකිය හැක. භරත නාට්‍ය දේවදාසී සංකල්පය මත ගොඩනැගුණු අතර කුච්චිපුඩි භගවතුළු යන බ්‍රාහ්මණ පරම්පරාව මත ගොඩනැගී ඇත.

ප්‍රමුඛ පද: කුච්චිපුඩි, භරතනාට්‍ය, දක්‍ෂිණභාරතය, ශාස්ත්‍රීය නර්තනය, ගැමිනාටක

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර*